..................................................................

ii. පහත දී ඇත්තේ මිනිස් පූර්ව ගාත්‍රයකි. a) එහි Y ලෙස සඳහන් අස්ථිය නම් කරන්න.

..................................................................

b) මෙහි X සන්ධි වර්ගය නම් කරන්න.

..................................................................

c) එම සන්ධිය පෙන්වන චලන ආකාර මොනවාද ?

..................................................................




22 A/L අපි [ papers group ]

iii. මිනිසාගේ පාදයේ ඇති වක්‍රවීම් සහ ඒවායේ පොදු කෘත්‍යය ලියන්න.

වක්‍රවීම් - ..................................................................

කෘත්‍යය - ..................................................................

..................................................................

iv. විලිවිත පේශි සංකෝචනය පිළිබඳව වර්තමානයේ පිළිගනු ලබන වාදය කුමක්ද ?

..................................................................

v.a) විලිඹිත පේශියක පුනරාවර්ති සංකෝචන ඒකකය නම් කරන්න.

..........................................................................................................

b) එම මූලික ඒකකය සෑදීමට දායක වන ප්‍රෝටීන මොනවාද ?

..........................................................................................................

c) පේශි සංකෝචනයේදී $Ca^{2+}$ වල කෘත්‍යය කුමක්ද ?

..........................................................................................................

100

04. (A) i) a) ශරීර වල ඇති සර්පැක්ටන්ට් වල ( පෘෂ්ඨාතති ශමකය) කෘත්‍ය කුමක්ද?

..........................................................................................................

..........................................................................................................

b) කළුගල්, පතල්කැනීම, පෙදරේරු වැනි කර්මාන්ත වල නියැලෙන පුද්ගලයින්ට වැළදෙන ස්වසන පද්ධතිය ආශ්‍රිත රෝගය කුමක්ද ?

..........................................................................................................

ii. මිනිසා තුල ක්‍රියාත්මක වන සහජ ප්‍රතිශක්තියේ බාහිර ආරක්ෂණ යාන්ත්‍රණ තුන නම් කරන්න.

22 A/L අපි [ papers group ]

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

iii. ප්‍රදාහක ප්‍රතිචාරයේදී ක්‍රියාත්මක වන සංඥා අණු මොනවාද ?

..........................................................................................................

..........................................................................................................

iv.සත්ත්ව දේහ වල මේදය ස්වායු ලෙස පරිවෘත්තියට භාජනය විමෙන් සෑදෙන බහිස්‍රාවි ඵල මොනවාද ?

..........................................................................................................

v. යූරික් අම්ලය බහිස්‍රාවයේ වාසි 2 ක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(B) i. a) ආහාර දාමයක් යනු කුමක්ද ?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

b)




ඉහත A ස්ථානයේ සිටිය හැකි ජීවියා පෝෂණය අනුව හඳුන්වා දිය හැක්කේ කෙසේද ?

..........................................................................................................

c) මෙම ජාලයේ A ජීවියා පරිසර පද්ධතියේ ඉවත් වුවහොත් සිදුවිය හැකි සුලභම බලපෑම කුමක්ද ?

.............................................................................................................................

.............................................................................................................................

ii. ආහාර දාමයක එක් එක් පෝෂී මට්ටමේදී විභව ශක්තිය හානිවන ආකාර මොනවාද ?

.............................................................................................................................

.............................................................................................................................

iii. a) උණසන්නිපාතය සඳහා හේතුවන රෝග කාරක ක්ෂුද්‍රජීවියා නම් කරන්න.

.............................................................................................................................

b) බාල වර්ගයේ ලෝපස් වලින් ලෝහ නිස්සාරණය සඳහා යොදා ගන්නා බැක්ටීරියාව කුමක්ද ?

.............................................................................................................................

iv. a) පහත දැක්වෙන ක්‍රියාකාරිත්වයක් පෙන්වන ප්‍රතිජීවක සඳහා උදාහරණයක් බැගින් ලියන්න.

1. සෛල බිත්ති සංස්ලේෂණය නිශේධනය.............................................................

2. ප්‍රෝටීන් සංස්ලේෂණය නිශේධනය.................................................................

b) අත්ත එල සෑදීම සඳහා භාවිතා වන ක්ෂුද්‍රජීවීන්ගේ පරිවෘත්තිය ක්‍රියාවලින්හි මූලික මූලධර්ම දෙකක් සඳහන් කරන්න.

1.............................................................................................................

2.............................................................................................................

v. a) ක්ෂුද්‍රජීවීන් ජෛව ප්‍රතිකර්මණය සඳහා යොදා ගන්නා අවස්ථාවක් සඳහන් කරන්න.

22 A/L අපි [ papers group ]

.............................................................................................................................

.............................................................................................................................

b) පානීය ජලයේ ගුණාත්මකභාවය පරික්ෂා කිරීම සඳහා සුචක ජීවියෙකු ලෙස භාවිත කරනුයේ කවර ක්ෂුද්‍රජීවී කාණ්ඩයද ?

.............................................................................................................................

(C) i.a) බහුජාන ආවේණිය යනු කුමක්ද ?

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

b) මිනිසාගේ බහුජාන ආවේණික ලක්ෂණයක් සඳහන් කරන්න.

.............................................................................................................................

c) පහත විස්තර කිරීමට අදාල වන අභිජනන ශිල්පක්‍රම මොනවාද ?

ප්‍රවේණිකව සමාන ඒකෙකයන් අතර අභිජනනය - ..........................................................

වෙනත් විශේෂ වලට අයත් පුං හා ජායා ජීවින් අතර අභිජනනය - .......................................

ii.a) පොලිපෙප්ටයිඩ සංස්ලේෂණය යන්ත්‍රණයට අදාලව ප්‍රතිලේඛනය යනු කුමක්ද ?

.............................................................................................................................

.............................................................................................................................

b) සුන්‍යාෂ්ටිකයින්ගේ පරිවර්තන පියවරේදී ආරම්භක ඇමයිනෝ අම්ලය සඳහා හේතුවන කෝඩෝනය කුමක්ද ?

......................................................................................................................................

iii.අලුතින් සංස්ලේෂණය වූ පොලිපෙප්ටයිඩයක සිදුවන පශ්චාත් පරිවර්තන විකරණ මොනවාද ?

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

iv.ආහාර පරිරක්ෂණයේ මූලික මූලධර්ම තුන සඳහන් කරන්න.

22 A/L අපි [ papers group ]

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

v. a) වෙන් කිරීම සහ බෙදීම යන වර්ධක ප්‍රචාරණ ක්‍රමයේදී භාවිත වන ශාක කොටස් දෙකක් සඳහන් කරන්න.

......................................................................................................................................

......................................................................................................................................

b) Polytunnels ඇතුළ හරිතාගාර වල වගා කරනු ලබන ඵලවළු වර්ග දෙකක් සඳහන් කරන්න.

......................................................................................................................................

......................................................................................................................................

100

******

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்தியமாகாணகல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස.(උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2022

| ජීව විද්‍යාව II | 09 S II | 13 ශ්‍රේණිය |
|---|---|---|

උපදෙස් - * ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
අවශ්‍ය තැන්හිදී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
( එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි )

## B කොටස - රචනා

05. a) හරිතලවයක සියුම් ව්‍යුහය පහදන්න.

b) $C_3$ ශාකයකදී $CO_2$ අණුවක් තිර වන ආකාරය විස්තර කරන්න.

06. a) ද්විතියික වර්ධනය යනු කුමක්ද ?

b) කාෂ්ඨීය බහුවාර්ෂික ශාක කඳක පරිධිය වැඩි වන ආකාරය පැහැදිලි කරන්න.

07. මුත්‍රා සෑදීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

08. a) DNA ප්‍රතිවලිතයේදී සහභාගි වන එන්සයිම සහ ප්‍රෝටීන නම් කර ඒවායේ කාර්යයන් සඳහන් කරන්න.

b) නයිට්‍රජන් චක්‍රය තුළ ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න.

09. a) මිනිසාගේ ලිංගය නිර්ණය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

b) නිවර්තන වනාන්තර බියෝමයෙහි ලක්ෂණ විස්තර කරන්න.

10. පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

a) මිනිසාගේ රුධිර ග්ලූකෝස් සාමාන්‍ය සීමාව ඉක්මවූ විට සමස්ථිතික යාමනය

b) ආකියා අධිරාජධානිය

c) මූලික සෛල චිකිත්සාව

22 A/L අපි [ papers group ]

******

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස.(උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2022

| ජීව විද්‍යාව II | 09 S II | 13 ශ්‍රේණිය |
|---|---|---|

උපදෙස් - * ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
අවශ්‍ය තැන්හිදී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
( එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි )

## B කොටස - රචනා

05. a) හරිතලවයක සියුම් ව්‍යුහය පහදන්න.
b) $C_3$ ශාකයකදී $CO_2$ අණුවක් තිර වන ආකාරය විස්තර කරන්න.

06. a) ද්විතියික වර්ධනය යනු කුමක්ද ?
b) කාෂ්ඨීය බහුවාර්ෂික ශාක කඳක පරිධිය වැඩි වන ආකාරය පැහැදිලි කරන්න.

07. මුත්‍රා සෑදීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

08. a) DNA ප්‍රතිවලිතයේදී සහභාගි වන එන්සයිම සහ ප්‍රෝටීන නම් කර ඒවායේ කාර්යයන් සඳහන් කරන්න.
b) නයිට්‍රජන් චක්‍රය තුළ ක්ෂුද්‍රජීවීන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න.

09. a) මිනිසාගේ ලිංගය නිර්ණය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
b) නිවර්තන වනාන්තර බියෝමයෙහි ලක්ෂණ විස්තර කරන්න.

10. පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.
a) මිනිසාගේ රුධිර ග්ලූකෝස් සාමාන්‍ය සීමාව ඉක්මවූ විට සමස්ථිතික යාමනය
b) ආකියා අධිරාජධානිය
c) මූලික සෛල චිකිත්සාව

22 A/L අපි [ papers group ]

******

ජීව විද්‍යාව - 13 ශ්‍රේණිය     මධ්‍යම පළාත

2022 - පෙබරවාරි පරීක්ෂණය

ව්‍යුහගත රචනා පිළිතුරු පත්‍රය

(1) A i) අනුවර්තනය : • ජීවියෙකු ජීවත්වන ආවාසයේ පරිසරයට අනුකූලව එම ජීවියාගේ හැඩය හා ක්‍රියාකාරීත්වය අනුගත වීම
• ව්‍යුහමය ක්‍රියාකාරීත්ව හා හැසිරීමය වෙනස් වීමයි .
(2 x 2½)

පරිණාමය : විශේෂයන් අඛණ්ඩව වෙනස්වීම තුළින් කාලය සමඟ නව විශේෂයන් බිහි කිරීමේ ක්‍රියාවලිය (1 x 2½)

22 A/L අපි | paper

ii) 1. පරිසර දූෂණය .
2. ජෛව විවිධත්ව හානිය .
3. කාන්තාරකරණය .
(3 x 2½)

iii) ෆෙරමෝන
(1 x 2½)

iv)



R දාමය
R දාමය
පොදු කොටස } (3 x 2½)

v) ප්‍රාථමික ව්‍යුහය
ද්විතීයික ව්‍යුහය .
තෘතීයික ව්‍යුහය .
චාතුර්ථ ව්‍යුහය .
(4 x 2½)
( ව්‍යුහය වෙනුවට ප්‍රෝටීන ලෙස සඳහන් වූ විට ලකුණු නැත )

B) i) A - ෆොස්ෆොලිපිඩ
B - තීර්යක් පටල ප්‍රෝටීන / අනුකලිත ප්‍රෝටීන
C - ග්ලයිකොප්‍රෝටීන
(3 x 2½)

ii) ෆොස්ෆොලිපිඩ අණු චලනය වේ (1 x 2½)

iii) ඌනනය I යෝග කලාව I / ඌනනය I යෝග කලාව / ඌනනය යෝග කලාව I
(1 x 2½)

iv) ප්‍රභා ෆොස්ෆොරයිලීකරණය
උපස්තර ෆොස්ෆොරයිලීකරණය
ඔක්සිකාරක ෆොස්ෆොරයිලීකරණය (3 x 2½)

v) ATP සර්වත්‍ර ශක්ති වාහකයකි.

$NAD^+$ සහ එන්සයිම ලෙස ක්‍රියා කරයි. / ඉලෙක්ට්‍රෝන වාහකයක් ලෙස ක්‍රියා කරයි / <u>ශ්වසනයේදී</u> ඔක්සිකාරකයක් ලෙස ක්‍රියාකර

$NADP^+$ සහ එන්සයිමයක් ලෙස ක්‍රියා කරයි. / ඉලෙක්ට්‍රෝන වාහකයක් ලෙස ක්‍රියා කරයි. / ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.

FAD සහ එන්සයිමයක් ලෙස ක්‍රියාකරයි / ඉලෙක්ට්‍රෝන වාහකයක් ලෙස ක්‍රියා කරයි / ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.

($NAD^{\pm}$ හා $NADP^{\pm}$ එකම විය යුතුය.) ඕනෑම $(4 \times 2\frac{1}{2})$

c) i) ජීවීන් අතර පවතින සහය | පරිණාමික සම්බන්ධතා පදනම් කරගෙන ජීවීන් කාණ්ඩ කිරීමයි. $(1 \times 2\frac{1}{2})$

ii) අධිජනනය
ප්‍රභේදනය
තරඟය හා උචිතතමයාගේ පැවැත්ම
හිතකර ලක්ෂණ ඊළඟ පරම්පරාවට උරුම වීම. $(4 \times 2\frac{1}{2})$

iii) 1. අවම තරමින් කලල විකසනයේදී හෝ කවරක් පෘෂ්ඨරජ්ජුව නමැති ආධාරක නම්‍යශීලී දණ්ඩාකාර ව්‍යුහය පැවතීම.
2. පෘෂ්ඨ රජ්ජුවට පෘෂ්ඨීයව පිහිටා කුහරමය නාලාකාර ස්නායු රජ්ජුව.
3. කලල අවස්ථාවේදීවත් ග්‍රසනි ජලක්ලෝම යුගල තිබීම.
4. කලල අවස්ථාවේදීවත් ගුදයට පශ්චාත් වලිගය පිහිටීම.
5. බොහෝ කෝඩේටාවන් තුළ උදරීය හෘදය
ඕනෑම කරුණු 3ක් $(3 \times 2\frac{1}{2})$

iv) a) <u>*Nephrolepis*</u>
b) <u>*Lycopodium*</u>
c) <u>*Gnetum*</u> $(3 \times 2\frac{1}{2})$

v) <u>*Mucor*</u> — සංයෝගාණුව
<u>*Agaricus*</u> - බැසිඩියෝ ඵලය / බැසිඩියම
<u>*Penicillium*</u> - අලිංගික බීජාණු / අලිංගය. $(3 \times 2\frac{1}{2})$ ②

$40 \times 2\frac{1}{2} = 100$

(2) A i) a) • ශාකයක වර්ධනය හා විකාසනයේදී ආලෝකය මගින් ක්‍රියාරම්භ වන ප්‍රධාන සිදුවීම් සියල්ල.
හෝ
ආලෝකය මගින් ශාකයක වර්ධනය හා විකාසන ක්‍රියාවලියේදී ප්‍රේරණය කරනු ලබන සිදුවීම් (1 x 2½)

b) 1. රතු ආලෝක ප්‍රතිග්‍රාහක / ෆයිටොක්‍රෝම
2. ක්‍රිප්ටොක්‍රෝම (2 x 2½)

ii)

| ශාක හෝමෝනය | කාර්යය |
|---|---|
| ඇබ්සිසික් අම්ලය | • ABA නිපදවීම හා නිදහස් වීම උත්තේජනය වී පූටිකා වැසී යයි.<br>• තවත් බීජ රෝපම් වී විශේෂ වර්ග වලය අවුරු ඇතිම.<br>• සමහර ශාක බීජ ජනනය කරයි. |
| එතිලීන් | • එතිලීන් ලුහුම් මගින් වැඩි ප්‍රමාණ ඇති එතිලීන් ජලය පරිවහනය හරහා බැහැර කිරීම<br>• ඉහළ සාන්ද්‍රණ දරා ගත හැකි ශාකවල සංවේදී ඉවසා සිටීම දැක්වීම. |

ඕනෑම කරුණු 2ක් (2 x 2½)

iii) a) Zn (1 x 2½)

b) K (1 x 2½)

iv) * උත්ස්වේදනය පූටිකා, උපචර්මය සහ වාතසිදුරු හරහා සිදුවන අතර බිංදුදය තුළ වල ජල බිඳු හරහා සිදුවේ.
* උත්ස්වේදනය දිවා කාලයේ සිදුවන අතර බිංදුදය රාත්‍රී කාලයේදී සිදුවේ.
* උත්ස්වේදනය සඳහා මූල පීඩනයේ බලපෑමක් නොමැති අතර බිංදුදය මූල පීඩනය හේතුවෙන් ප්‍රකටව වේ.
* උත්ස්වේදනයේදී ශාකයෙන් ජලය වාෂ්ප ලෙස ඉවත්වන අතර බිංදුදයේදී ද්‍රව ජලය බැහැර වේ.

(ඕනෑම කරුණු 2ක් 2 x 2½)

v) a) ඇපොප්ලාස්ට (මාර්ගය)
සිම්ප්ලාස්ට (මාර්ගය)
පටල හරහා සම්ප්‍රේෂණ (මාර්ගය) (3 x 2½)

22 A/L අපි [papers group]

b) • දිවා කාලයේදී තාලක සෛල තුලට $K^+$ සක්‍රීයව ඇතුල් වේ.

• එහි ද්‍රාවය විභවය වැඩිවී (යාබද අපිචර්මීය සෛල වලට සාපේක්ෂව) ජල විභවය අඩුවේ.

• එවිට ආසෘතියෙන් ජලය තාලක සෛල තුලට ඇතුල් වේ

• තාලක සෛල වල ශූනතාවය වැඩිවී පූටිකාව විවෘත වේ

(4 × 2½)

B) i) තන්තු වර්ගය . කාර්යය.

කොලැජන් ශක්තිය හා ප්‍රත්‍යාස්ථතාව සැපයීම.

ජාලාකාර තන්තු (කණිකාමය පටක) යාබද පටක වලට බැඳීම

ප්‍රත්‍යාස්ථ තන්තු පටකයේ ප්‍රත්‍යාස්ථ බව ඇති කිරීම.

(6 × 2½)

ii) a) ඔස්ටියෝසයිට (1 × 2½)

b) කොන්ඩ්‍රොසයිට් : කල්ලේණි (1 × 2½)

iii) a) (සරල කාබනික පූර්වග අණු වලින්) ශරීරය තුල සංශ්ලේෂණය කල නොහැකි ආහාරය මගින් ලබා ගත යුතුම වන ඇමයිනෝ අම්ල.

(1 × 2½)

b) ලයිසීන් / හිස්ටිඩීන් / ලියුසීන් / මෙතියොනීන් . (1 × 2½)

iv) • දිගු වේලාවක් කුසගින්නේ සිටීම

• මානසික ආතතිය

• ඇස්ප්‍රීන් වැනි සමහර ඖෂධ වර්ග භාවිතය

(ඕනෑම කරුණු 2ක් 2 × 2½)

v)

ගැස්ට්‍රින් - ආමාශයික යුෂ නිදහස් කිරීම උත්තේජනය

කොලිසිස්ටොකයිනින් - පිත්තාශයෙන් පිත නිදහස් කිරීම.

අග්න්‍යාශයෙන් ජීරණ එන්සයිම නිදහස් කිරීම

(2 × 2½)

C) i a) මුළු දේහය පුරාම සිදුවන පූර්ණ සංසරණයකදී

• රුධිරය හෘදය තුළින් එක් වරක් පමණක් ගමන් කිරීම

(1 × 2½)



22 A/L අපි [ papers

b) (හිස්) → උත්තර මහා ශිරාව / පූර්ව මහා ශිරාව → දකුණු කර්ණිකාව → (ත්‍රිකුස්පිඩ කපාටය) → දකුණු කෝෂිකාව → පුප්ඵුසීය ධමනිය → (අඩසඳ කපාට) → පෙනහළු.

(1 × 2½)

ii) a. වසා වාහිනී / විශාල වසා වාහිනී සහ දකුණු වසා වාහිනී.
වසා ගැටිති
වසා පටක / Tonsil
වසා අවයව / ප්ලීහාව සහ තයිමසය

(ඕනෑම තුනක් 2 × 2½)

b) 1. රුධිර පරිමාව පවත්වා ගැනීම.
2. (ක්ෂුද්‍රාන්ත්‍රයේ) මේද හා මේද ද්‍රාව්‍ය විටමින් අවශෝෂණය
3. ප්‍රතිශක්ති ප්‍රතිචාර දැක්වීම.

(ඕනෑම තුනක් 2 × 2½)

iii) SA ගැටය / සයිනෝ කර්ණික ගැටය. (1 × 2½)

iv) කෝෂිකා විධ්‍රැවණය / AV ගැටයේ සිට කෝෂිකා බිත්තියේ ප්‍රාචීරය (වේගවත්) ගෙනයාම සහ කෝෂිකා පේශී වල විද්‍යුත් ක්‍රියාකාරිත්වය (1 × 2½)
(කෝෂිකා සංකෝචනය සඳහා ලකුණු නැත)

v) $HCO_3^-$ ලෙස
කාබමිනෝ හීමොග්ලොබින් ලෙස.
රුධිර ප්ලාස්මාවේ දියවී.

(ඕනෑම තුනක් 2 × 2½)

(40 × 2½)

22 A/L අපි [ papers group

(3) A i) a Annelida , Arthropoda.
(2 × 2½)

b) A - මස්තිෂ්කය.
B - සුෂුම්නා ශීර්ෂකය.
C - අනුමස්තිෂ්කය.
(3 × 2½)

c) • ඉච්ඡානුග පේශී / කංකාල පේශී චලන සමායෝජනය
• ඉරියව්ව හා සමබරතාවය පවත්වා ගැනීම
• චාලක හැකියා ඉගෙනීමට හා මතක තබා ගැනීමට උපකාරී වීම.
( ඕනෑම කරුණු 2ක් 2 × 2½ )

ii) a) එපිනෙප්‍රින් / ඇඩ්‍රිනලින් (1 × 2½)

b) මොළයේ කඳෙන්
ත්‍රිකාස්ථික ප්‍රදේශයෙන් (2 × 2½)

iii) $Na^+$ සෛලයෙන් බාහිර වීම. (1 × 2½)

iv) ඇක්සනයේ විෂ්කම්භය.
මයලීනීකෘත ඇක්සන තිබීම (2 × 2½)

v) 1. $Ca^{2+}$ විසරණය නිසා ස්නායු සම්ප්‍රේෂක සහිත උපාගම ආශයිකා පූර්ව උපාගම පටලයට බැඳීම
2. ස්නායු සම්ප්‍රේෂක උපාගම කුහරය තුළට නිදහස් වීම.
3. ස්නායු සම්ප්‍රේෂක උපාගම කුහරය හරහා විසරණය.
4. ස්නායු සම්ප්‍රේෂක පශ්චාද් උපාගම පටලයේ පිහිටි ප්‍රතිග්‍රාහක වලට බැඳී ඒවා සක්‍රිය කිරීම.
5. පශ්චාද් උපාගම පටලය හරහා $K^+$ හා $Na^+$ අයන විසරණය.
( ඕනෑම කරුණු 3ක් 3 × 2½ )

B) i) a) කෝර්ටි අවයවය. (1 × 2½)
b) සමතුලිතතාවය (1 × 2½)

ii) ඔටෝලිත් (1 × 2½)

iii) පැරාතයිරොයිඩ් හෝමෝනය / PTH - පැරාතයිරොයිඩ ග්‍රන්ථිය.
(2 × 2½)

iv) Hydra - අංකුරණය.
බඹරුන් - පාර්තනෝජනිසය
සමහර ඇනෙලිඩාවන් - කැබලි වීම සහ පුනර්ජනනය.
(3 × 2½)

22 A/L අපි [ papers group ]

v) ද්විතීයික අවශෝෂණ ශෛලය. (1 × 2 1/2)

c) i) a) සංවේදක වර්ගය : රසායනික

සංවේදක ඇතුළත් ස්ථානය : සංවේදක ප්‍රදේශ
නිර්ගාමී ස්නායු (3 × 2 1/2)

b) ආවේග සංවේදනාව, පසු කපාලයේ අවර භාගය ස්නායු අනු (1 × 2 1/2)

ii) a) ආරම්භය (1 × 2 1/2)

b) අන්තය (1 × 2 1/2)

c) සංකෝචන

ප්‍රසාරණ (2 × 2 1/2)

iii) • නිරයත්

• ඉන්ධනාගාර

• ඇටසැකිල්ල හෝ එකතැන සිටින විට ඉදිගම් කර සඳහා සිරුරේ සමතුලිතතාව පවත්වා ගැනීම. (3 × 2 1/2)

iv) සර්පණ සූත්‍රිකා වාදය (1 × 2 1/2)

v) a) සාකෝමියරය (1 × 2 1/2)

b) ඇක්ටින් සහ මයෝසින් (දෙකම නිවැරදි නම් 1 × 2 1/2)

c) ඇක්ටින් වල බන්ධන ස්ථාන නිරාවරණය වීම (1 × 2 1/2)

(40 × 2 1/2)

(4) A i) a) සංස්ලේෂිත ආහාරය ඇති කිරීමෙන් / බාහිර සංස්ලේෂිත ආහාරයෙන් ගර්භ බිඳ වැටීම මැලැවීම (1 × 2 1/2)

b) ක්ලෝරෝසිස්. (1 × 2 1/2)

ii) 1. පසෙහි තඹුරු සාන්ද්‍ර ආර්ද්‍රතාව හෝ සාධක / සම

2. ෆ්ලෝයම් පටලය.

3. විවිධ අවයව පෙන්ත් කරන ස්‍රාවයන් (3 × 2 1/2)

iii) ජිබරලින්

සයිටොකයිනින (2 × 2 1/2)

iv) $CO_2$ සහ $H_2O$ (2 × 2 1/2)

v) විෂ රසය වීම.

ජල අවශෝෂණ වීම / කෛශිකාවල ද්‍රව සිද්ධියක් අවශෝෂණය වීම. (2 × 2 1/2)



22 A/L අපි [ papers gr

(B) i) a) පරිසර පද්ධතියක ප්‍රාථමික නිෂ්පාදකයා හෝ ආරම්භ වී එක් පෝෂී මට්ටමකින් තවත් පෝෂී මට්ටමකට පෝෂක හා ශක්තිය ගමන් කරන ජීවීන්ගේ රේඛීය අනුක්‍රමයකි. (1 x 2 1/2)

b) ආහාර ජාලය (1 x 2 1/2)

c) හරිතාගාර ආහාර සැපයීම / හරිත ආහාර අඩු වීම / හරිත ශාක විනාශ වීම (1 x 2 1/2)

ii) කෘමියා
සිවුපාය (2 x 2 1/2)

iii) a) Salmonella typhi
b) Thiobacillus ferrooxidans (1 x 2 1/2)
(1 x 2 1/2)

iv) a) පෙනිසිලින්
එරිත්‍රොමයිසින් / ටෙට්‍රාසයික්ලින් (2 x 2 1/2)

b) අත්තමල ලෙස ක්ෂුද්‍ර ජීවී සෛල සොදා ගැනීම
- අත්තමල ලෙස ක්ෂුද්‍ර ජීවී පරිවෘත්තීය ඵල සොදා ගැනීම.
- අත්තමල ලෙස ක්ෂුද්‍ර ජීවී පරිවෘත්තීය ක්‍රියාවලි සොදා ගැනීම.
- අත්තමල ලෙස ගැනීමට ප්‍රවේණිකව විකරණය කළ ක්ෂුද්‍ර ජීවීන් සොදා ගැනීම.
(ඕනෑම කරුණු 2  2 x 2 1/2)

v) a) - තෙල් ඉහිරුම් / බැර ලෝහ අපද්‍රව්‍ය / කාබනික අපද්‍රව්‍ය මගින් අපවිත්‍ර වූ පස හා ජලය ප්‍රතිකර්මණය කිරීමට
- ආහාර සැකසුම් හා රසායනික ජීරණ වල අපද්‍රව්‍ය විශෝධනය සඳහා
(ඕනෑම කරුණු 1  1 x 2 1/2)

b) කෝලිෆෝම් බැක්ටීරියා (1 x 2 1/2)

c) i a) ජාන දෙකක හෝ ඊට වැඩි ගණනක සම්මුචිත ප්‍රකාශනය නිසා ප්‍රමාණාත්මක ලක්ෂණ වලට අදාළ ඵලයන් දර්ශයක ආවේණිගත වීම. (1 x 2 1/2)

b) උස / සමේ වර්ණය / බුද්ධි මට්ටම (1 x 2 1/2)

c) - සහසම්බන්ධනය
- අහිතර විශේෂ ආරෝපනය (2 x 2 1/2)



22 A/L අපි [ papers group ]

ii) a DNA හි අනුක්‍රමය mRNA තුළට පිටපත් කිරීම (1 x 2 1/2)

b) AUG (1 x 2 1/2)

iii) 1. ජීන්, විවිධ ජෛවීන්ට හා වෙනත් ඛණ්ඩ එකතු කිරීම මගින් අභිමතානුකූල ගුණ වල සංයෝජක විකෘතීන්.

2. මෙතියොනීන් ඇමයිනෝ අම්ලය ඉවත් කිරීම.

3. ආරම්භක පොලිපෙප්ටයිඩය කෑලි දෙකකට හෝ වැඩි ගණනකට කැඩීමෙන් සහ වෙනස් සංකලන සම්බන්ධ කිරීමෙන් නානාවිධ ප්‍රෝටීන සෑදීම.

(3 x 2 1/2)

iv) 1. ආහාරයට ක්ෂුද්‍රජීවීන් ඇතුල් වීම වැලැක්වීම.

2. ආහාරයේ සිටින ක්ෂුද්‍රජීවීන්ගේ වර්ධනය හා ක්‍රියාකාරීත්වය වැලැක්වීම.

3. ආහාරයේ පවතින ක්ෂුද්‍රජීවීන් විනාශ කිරීම. (3 x 2 1/2)

v) a) තෙල් / ආරෝග්‍යකර / මාංශ / රසකාරක / බෙහෙත්.

ඕනෑම 2ක් (2 x 2 1/2)

b) බෙල් පෙත්ත

තම්බාලි

සලාද පිච්චුවා

සලාද කොළ

ඕනෑම 2ක් (2 x 2 1/2)

(40 x 2 1/2)

22 A/L අපි [ papers group ]

මධ්‍යම පළාත.

පිළිතුරු. ජීව විද්‍යාව 13 ශ්‍රේණිය 2022 III වාරය

(5). i. හරිතලවයක සියුම් ව්‍යුහය පහදන්න.




1. ද්වි උත්තල කාච හැඩැතිය.
2. පටල දෙකකින් වට වූ ඉන්ද්‍රියිකාවකි.
3. පිටත සහ ඇතුළත පටල සිනිඳුය.
4. එවා ඉතා පටු අන්තර් පටල අවකාශයකින් වෙන් වී ඇත.
5. හරිතලවය තුළ තවත් පටල පද්ධතියකි.
6. මෙම පටල මගින් තයිලකොයිඩ ලෙස හඳුන්වන අන්තර් සම්බන්ධිත පැතලි මලු සාදයි.
7. මෙම තයිලකොයිඩ වල ප්‍රභාසංශ්ලේෂක වර්ණක වලින් සැදුම් ප්‍රභා පද්ධති ලෙස හඳුන්වන සංකීර්ණ ඇත.
8. තයිලකොයිඩ එක මත එක පිහිටා පංජර කණිකාවක් / ග්‍රැනා සාදයි.
9. පංජර කණිකා අන්තර් පංජර කණිකා ප්‍රවර්ත මගින් එකිනෙක සම්බන්ධවේ.
10. තයිලකොයිඩ වලට පිටතින් ඇති තරලය පංජරය ලෙස හැඳින්වේ.
11. පංජරයේ වෘත්තීය DNA / හරිතලව DNA, 70S රයිබොසෝම, බොහෝ එන්සයිම, පිෂ්ට කණිකා සහ ලිපිඩ බිඳිති ඇත.
(3 ක් වත් තිබිය යුතුය.)

ii. $C_3$ ශාකයක දී $CO_2$ අණුවක් තිර වන ආකාරය පහදන්න.

1. මෙම ක්‍රියා ශ්‍රේණිය හරිතලව පංජරයේ සිදුවේ.
2. මෙහිදී ආලෝක ප්‍රතික්‍රියාවෙන් නිපදවුණු ATP හා NADPH වල ශක්තියෙන් $CO_2$ ඔක්සිහරණය වේ.
3. මෙය / කැල්වින් චක්‍රය පියවර 3 ක් සමන්විතය.
4. කාබොක්සිලීකරණය / C තිර කිරීම
5. ඔක්සිහරණය
6. $CO_2$ ප්‍රතිග්‍රාහකය / RuBP පුනර්ජනනය කිරීම.



22 A/L අපි [ papers group

7. කාබොක්සිල්කරණයේදී 5C යුත RuBP / රිබියුලෝස් බිස් පොස්පේට් $CO_2$ ප්‍රතිග්‍රාහකය / එනම් එම සිටුව.

8. මෙම ප්‍රතික්‍රියාව RuBP කාබොක්සිලේස් - ඔක්සිජනේස් / Rubisco මගින් උත්ප්‍රේරණය කරයි.

9. ප්‍රථම ඵලය ලෙස 6C සංයුතියෙන් යුත අස්ථායි අණුවක් සෑදේ.

10. එය වහාම (11) 3C 3-පොස්පොග්ලිසරේට් / 3-PGA

12 අණු 2ක් බවට බිඳේ.

13. මෙය ප්‍රභාසංශ්ලේෂණයේදී සෑදෙන ප්‍රථම ස්ථායි ඵලයයි.

14. 3-PGA වලට (ආලෝක ප්‍රතික්‍රියාවෙන් සැපයූ) ATP වලින් එක් පොස්පේට් කාණ්ඩයක් එක් වේ.

15. එමගින් 1, 3 - බිස්පොස්පොග්ලිසරේට් සෑදේ.

16. මෙම 1, 3 - බිස්පොස්පොග්ලිසරේට්, NADPH වලින් ග්ලිසරැල්ඩිහයිඩ් 3 - පොස්පේට් / $G_3P$ බවට ඔක්සිහරණය වේ.

17. මෙය එන්සයිම උත්ප්‍රේරිතය.

18. මෙම ප්‍රතික්‍රියාව සඳහා ආලෝක ප්‍රතික්‍රියාවේ නිපදවූ NADPH සහ ATP වැය කරයි.

19. මෙම $G_3P$ කාබෝහයිඩ්‍රේට / ග්ලූකෝස් සංශ්ලේෂණයේ පූර්වග අණුව.

20. $G_3P$ එක් අණුවක් ශුද්ධ සංශ්ලේෂණය සඳහා කැල්වින් චක්‍රය තෙවරක් සිදු විය යුතුය.

21. $G_3P$ (පහක්) එන්සයිම උත්ප්‍රේරිත (22) සංකීර්ණ ප්‍රතික්‍රියා ශ්‍රේණියක් ඔස්සේ ගොස්

23. RuBP ප්‍රතිජනනය වේ.

24. මෙම ක්‍රියාවලිය සඳහා ආලෝක ප්‍රතික්‍රියාවේ නිපදවූ ATP වැයවේ.

25 (ඉතිරි) $G_3P$ වලින් එන්සයිම උත්ප්‍රේරිත ප්‍රතික්‍රියා ඔස්සේ ග්ලූකෝස් සංශ්ලේෂණය වේ.

11 + 25 — 36 × 4 - 144

ව. සංගත - 6 (නිවැරදි ආරූපය ඇතිව නම් පමණි 6 ම)

**150**

22 A/L අපි [ papers group

(6) i. ද්විතියික වර්ධනය යනු කුමක්ද?

1. පාර්ශ්වික විභාජක මගින් / වල්ක කැම්බියම හා සනාල කැම්බියම මගින් නිපදවනු ලබන නව සෛල හේතුවෙන්
2. ශාක <u>කඳන් හා මූල් වල</u> විෂ්කම්භය වැඩි වීමයි.

ii. කාෂ්ඨීය බහු වාර්ෂික ශාක කඳක පරිධිය වැඩි වන ආකාරය පැහැදිලි කරන්න.

1. කාෂ්ඨීය ශාක වල ප්‍රාථමික වර්ධනය හා ද්විතියික වර්ධනය එකවර සිදුවේ.
2. (ශාකයේ ලපටි කොටස් වල ප්‍රාථමික වර්ධනය සිදු වෙමින් කඳ හා මූල දිගින් වැඩි වන අතර) ද්විතියික වර්ධනය සිදු වෙමින් ප්‍රාථමික වර්ධනය නැවතී ඇති ශාක කඳෙහි විෂ්කම්භය වැඩි කරයි.
3. සනාල කැම්බියම විභේදනය නොවූ තනි සෛල ස්තරයකින් සැදුනු
4. අඛණ්ඩ සිලින්ඩරයක් ලෙස ඇත.
5. මෙය මජ්ජාවට යාබද ප්‍රාථමික ශෛලමයට පිටතින්
6. ප්‍රාථමික ෆ්ලෝයමයට යාබද ඇතුළතින් පිහිටයි.
7. හරස්කඩකදී මෙය මවුලික වලයක් සේ දිස් වේ.
8. මෙහි සමහර මවුලික සෛල දික් හැඩයක් ගන්නා අතර
9. එවා ශාක කඳේ දික් අක්ෂය ඔස්සේ ... දික් අක්ෂයට සමාන්තරව පිහිටයි
10. අනෙක් මවුලික සෛල කෙටි වන අතර,
11. එවා කඳේ අක්ෂයට ලම්භකව පිහිටයි.
12. මෙම සනාල කැම්බියම ක්‍රියාකාරී වී ද්විතියික සනාල වටක නිපදවයි.
13. මෙහිදී සනාල කැම්බියමෙන් ඇතුළට / (ප්‍රාථමික සෛලම දෙසට) ද්විතියික සෛලමය නිපදවන අතර
14. එයට වාහිනී ඒකක, වාහකාභ, සෛලමීය මෘදුස්තර හා තන්තු නිපදවයි
15. බාහිරට / පිටතට / (ප්‍රාථමික ෆ්ලෝයම දෙසට) ද්විතියික ෆ්ලෝයම නිපදවන අතර.
16. එයට පෙනේර නල ඒකක, සහචර සෛල, ෆ්ලෝයම තන්තු හා ෆ්ලෝයම මෘදුස්තර නිපදවයි.
17. මෙම සෛල මගින් නිපදවනුයේ / ද්විතියික සනාල වටක නිපදවනුයේ සනාල කැම්බියමේ දික් අක්ෂයට සමාන්තර මවුලික සෛල මගිනි.
18. සනාල කැම්බියමෙහි ඇති කෙටි මවුලික සෛල මගින් සනාල කිරණ සාදයි.
19. මෙහි ඇති මෘදුස්තර සෛල මගින් ද්විතියික සෛලම හා ද්විතියික ෆ්ලෝයම එකිනෙක සම්බන්ධ කරයි.
20. තවද මෙම සෛල කාබෝහයිඩ්‍රේට සංචිත කිරීමටත්
21. ජලය හුවමාරුවට ආධාර වේ.

22. සනාල කැම්බියමේ සෛල විභාජනය නිසා ඵහි පරිධිය වැඩි කර ගනී.

23. ද්විතියික වර්ධනය / පරිධිය වැඩි වන විට කඳෙහි අපිචර්මය ඉවතට තල්ලු වී යයි.

24. ඵවිට එය පිපිරී ඉරී ගැලවී යයි.

25. ඒ නිසා බාහිකයේ බාහිර සෛල ස්ථරයෙන් සෛල ස්ථරයක්/ස්ථර කිහිපයක් විභාජක හැකියාව ලබා ගනී.

26. එය වල්ක කැම්බියම ලෙස හඳුන්වයි.

27. වල්ක කැම්බියම මගින් බාහිරට / පිටතට නිපදවන සෛල වල්කයයි.

28. වල්ක සෛල පරිණත වීමේදී ඒවායේ බිත්ති තුළ සුබෙරින් තැන්පත් වේ.

29. මේවා, ජල භීතික ද්‍රව්‍යයකි.

30. ඵවිට සෛල අජීවී වේ.

31. වල්ක කැම්බියමත් ඉන් නිපදවන පටකත් පරිචර්මය ලෙස හඳුන්වයි.

32. ඵය ජලයට හා වායු වලට අපාරගම්‍යයි.

33. පරිචර්මයේ ලිහිල්ව සැකසුණු වල්ක සෛල වලින් වාත රන්ධ්‍ර ලෙස හඳුන්වන කුඩා සිදුරු සැකසී ඇත.

34. ඒවා, මගින් වායු හුවමාරුව සිදු වේ.

35. කඳෙහි වර්ධනය තව දුරටත් සිදු වන විට වල්ක කැම්බියම වැඩී යන අතර, ඵහි විභාජක හැකියාව නැති වී වල්කය බවට පත් වේ.

36. ඵවිට ඇතුළතින් නව වල්ක කැම්බියමක් සාදනු ලබන අතර ඵමගින් නව පරිචර්මයක් ඇති කරයි.




any 6 → 6

36×4 – 144
රූපය – 6
150

22 A/L අපි [ papers group ]

⑦. මූත්‍ර සෑදීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

1. මූත්‍ර සෑදීමේ ක්‍රියාවලියට අතිපරිස්‍රාවනය.
2. වරණීය ප්‍රතිශෝෂණය හා 22 A/L අපි [ paper
3. ස්‍රාවය යන පියවර 3 අයත්ය.
4. අතිපරිස්‍රාවනය යනු, අධික පීඩනයක් යටතේ ග්ලෝමරුලයේ ප්‍රාවර කුහරය තුළට කරලය පෙරී යාමයි.
5. මෙම කරලයේ / ශුද්ධිකා පෙරනයේ රුධිර සෛල, පට්ටිකා සහ විශාලම ප්‍රෝටීන වැනි විශාල අණු රහිත වන අතර
6. රුධිරයේ අඩංගු අනෙක් සියලුම සංඝටක/ ජලය, අයන, ඇමයිනෝ අම්ල, ග්ලූකෝස්, විටමින, නයිට්‍රජනීය අපද්‍රව්‍ය හා වෙනත් කුඩා අණු වර්ග අඩංගු කරලයකි.
7. මෙම කරලය අභිසාර සංවලිත නාලිකාවට ගමන් කරයි.
8. එහිදී (වරණීය ප්‍රතිශෝෂණය මගින්) $Na^+$, ග්ලූකෝස්, ඇමයිනෝ අම්ල
9. සක්‍රියව රුධිරයට / අන්තරාල තරලයට ඇතුළු කර ගනී.
10. එම සමගම $Cl^-$, $HCO_3^-$, $K^+$ බොහොමයක් අක්‍රිය විසරණය මගින් අන්තරාල තරලයට ප්‍රතිශෝෂණය වේ.
11. (පෙරනයේ සිට අන්තරාල තරලයට ද්‍රාව්‍ය ගමන් කළ නිසා) ආස්‍රැතිය මගින් අක්‍රියව
12. ජලය ප්‍රතිශෝෂණය වේ./ වැඩිම ජල ප්‍රමාණයක් ප්‍රතිශෝෂණය වේ.
13. පෙරනය අභිසාර සංවලිත නාලිකාව තුළින් ගමන් කරන විට $H^+$ සක්‍රියව ස්‍රාවය
14. $NH_3$ අක්‍රියව ස්‍රාවය වේ.
15. ඖෂධ වර්ග, විෂ ද්‍රව්‍ය, අක්මාවේදී පරිවෘත්තියට ලක් වූ සමහර ද්‍රව්‍යයද සක්‍රියව ස්‍රාවය කරයි.
16. මෙම සාන්ද්‍ර පෙරනය හෙන්ලේ පුඩුවේ අවරෝහන බාහුවට ඇතුල්වේ.
17. මෙහිදී ජලය අක්‍රියව, ආස්‍රැතිය මගින් ප්‍රතිශෝෂණය වන නිසා පෙරනය වඩාත් සාන්ද්‍ර වේ.

18. ඉන් පසු පෙරනය හෙන්ලේ පුඩුවේ අවරෝහණ බාහුව පසු කරමින් එහි ආරෝහණ බාහුවට පැමිණේ.

19. මෙහිදී ජල ප්‍රතිශෝෂණයක් සිදු නොවේ.

20. නමුත් $Na^+$ වැනි ප්‍රමාණයක් සක්‍රියව / NaCl සක්‍රියව මෙන්ම අක්‍රියව ප්‍රතිශෝෂණය වේ.

21. ජලය බැහැර නොවීම නිසා පෙරනය වඩාත් තනුක වේ.

22. තරලය විදුර සංවලිත නාලිකාවට ගමන් කරයි.

23. මෙම දේහ තරල වල $K^+$ හා $Na^+$ සාන්ද්‍රණ යාමනයට අදාළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

24. අධිවෘක්කාවයට ගැලපෙන පරිදි $K^+$ සක්‍රියව ස්‍රාවය වීමත්,

25. $Na^+$ සක්‍රිය ප්‍රතිශෝෂණයත් සිදුවේ.

26. $H^+$ ස්‍රාවයද

27. $HCO_3$ ප්‍රතිශෝෂණයද සිදුවේ.

28. මෙම තරලය සංග්‍රාහක ප්‍රණාලයට ගමන් කරයි.

29. ADH හෝමෝනයේ බලපෑම මත

30. විදුර සංවලිත නාලිකාව හා

31. සංග්‍රාහක ප්‍රණාලය මගින් ජලය ප්‍රතිශෝෂණය වැඩි කරයි.

32. (අධි වෘක්ක බාහික හෝමෝනයක් වන) ඇල්ඩොස්ටෙරෝන් මගින්

33. $Na^+$ සක්‍රිය ප්‍රතිශෝෂණය වැඩි කිරීමත් ජලය අක්‍රිය ප්‍රතිශෝෂණයත්

34. $K^+$ බහිස්‍රාවය වැඩි කිරීමත්

35. විදුර සංවලිත නාලිකාවේදී හා

36. සංග්‍රාහක ප්‍රණාලයේදී සිදුවේ.

37. එවිට තරලය සාන්ද්‍ර බවට පත් වෙමින් මුත්‍රා සාදයි.

38. තරලයේ අඩංගු අධික යූරියා සාන්ද්‍රණය නිසා සංග්‍රාහක ප්‍රණාලයේ යූරියා යම් ප්‍රමාණයක් විසරණය විය හැක. එම අන්තරාල තරලයට

39. සංග්‍රාහක ප්‍රණාලයේදී පෙරනය අවසන් සැකසීමෙන් පසු මුත්‍රා සෑදේ.

40. තනුක මුත්‍රා නිපදවන විට ආසෘතිය මගින් ජලය ප්‍රතිශෝෂණයට ඉඩ නොතබමින් ලවණ සක්‍රියව ප්‍රතිශෝෂණය කරයි.

any 38×4 → 150



22 A/L අපි [papers gro

(8) i. DNA ප්‍රතිවලිකරණයේදී සහභාගි වන එන්සයිම සහ ප්‍රෝටීන නම් කර, එවායේ කාර්යයන් සඳහන් කරන්න.

1. හෙලිකේස් 2. DNA දාමයේ අනුපූරක භෂ්ම යුගල අතර H බන්ධන බිඳ හෙලික්ස් දාම 2ක වෙන් කිරීම.

3. ටොපොඅයිසොමරේස් (4) DNA සංශ්ලේෂණයේ ඉදිරියෙන් ක්‍රියා කර DNA දාමයේ හෝ දාම 2හිම හෝ කැඩීම් සිදු කර ආතතිය සමනය සඳහා ඇඹරීම වලකිවා ඉනි
(5) අනතුරුව කැපූ කෙළවර නැවත එකතු කරයි.

22 A/L අපි [ papers group ]

6. තනි දාම බන්ධක ප්‍රෝටීන (7) නිරාවරණය වූ තනි දාම DNA වලට බැඳී නැවත දාම යළි යුගලනය වැළැක්වීම සහ ස්ථායී කිරීම සිදු කරයි.

8 ප්‍රයිමේස් (9) DNA අච්චුව මත රයිබොනියුක්ලියෝටයිඩ එක් කරමින් RNA සංශ්ලේෂණය ආරම්භ කරයි.

10 DNA පොලිමරේස් (11) මූලිකයේ 3' අන්තයට ඩිඔක්සිරයිබොනියුක්ලියෝටයිඩ එක් කරමින් DNA බහුඅවයවීකරණය ආරම්භ කිරීම.
(12) නව DNA දාමය 5' සිට 3' අන්තයට දිශා වන ලෙස බහුඅවයවීකරණය පවත්වා ගෙන යාම.
(13) වැරදි නියුක්ලියෝටයිඩයක් දාමයට එක් වුව හොත් එය හඳුනාගෙන බහිර්නියුක්ලියේස් ක්‍රියාව මගින් එය ඉවත් කිරීම. / සෝදුපත් කියවීම.

DNA ලයිගේස් (14) - අලුතින් සංශ්ලේෂණය වූ යාබද DNA ඛණ්ඩ යා කරමින් ෆොස්ෆො-
(15) ඩයිඑස්ටර බන්ධන සෑදීම මගින් සම්පූර්ණ DNA දාමයක් සෑදීම.

ii) $N_2$ චක්‍රය තුළ ක්ෂුද්‍ර ජීවීන්ගේ කාර්යභාරය විස්තර කරන්න.

1. $N_2$ චක්‍රයට ප්‍රධාන පියවර 4 ක් අඩංගුවේ. ඇමෝනීකරණය
2. නයිට්‍රීකරණය.
3. නයිට්‍රිහරණය.
4. නයිට්‍රජන් තිර කිරීම.
5. ඇමෝනීකරණය - ක්ෂුද්‍ර ජීවීන් විසින් ස්‍රාවය කරන බහිෂ්සෛලීය ප්‍රෝටියෝලිතික එන්සයිම මගින් මියගිය ශාක හා සත්ත්වයන්ගේ ප්‍රෝටීන ඇමයිනෝ අම්ල බවට වියෝජනය කිරීමයි.
6. මෙම ඇමයිනෝ අම්ල ක්ෂුද්‍ර ජීවී සෛල තුළට ලබා ගෙන ඇමෝනීකරණයෙන් / $NH_2$ වලින් $NH_3$ බවට පත් කරයි.
7. මෙම $NH_3$ පසේදී ජලයේ දියවී $NH_4^+$ බවට පත් වේ.
8. නයිට්‍රීකරණයේදී $NH_4^+$ වල ඇති $N_2$, $NO_3^-$ නිපදවීම සඳහා ඔ'කරණ වීමේ ක්‍රියාවලියයි.
9. මෙය පසේ සිටින වන නයිට්‍රීකාරී බැක්ටීරියා මගින් පියවර 2ක් සිදු කරයි.
10. *Nitrosomonas* මගින් $NH_4^+$, $NO_2^-$ බවට ඔ'කරණය කරයි.
11. ඉන් පසු *Nitrobacter* මගින් $NO_2^-$, $NO_3^-$ බවට ඔ'කරණය කරයි.
12. මෙම $NO_3^-$ ශාක භාවිතා කර (ආහාර දාම ඔස්සේ) සතුන්ට ලබා ගනී.
13. නයිට්‍රිහරණයේදී වායුගෝලීය $O_2$ රහිත වූ තත්වයන් හිදී
14. සමහර ක්ෂුද්‍ර ජීවීන් විසින් $NO_3^-$, $N_2$ බවට ඔ'හරණය කරයි.
15. මෙමගින් වායුගෝලයට $N_2$ නිකුත් වේ.
16. මෙමගින් පසේ පවතින $N_2$ ප්‍රමාණය අඩු වෙයි)
17. ජල ගලිත පසෙහි $O_2$ සීමිත බැවින් නයිට්‍රිහරණය නිරන්තරයෙන්ම සිදුවේ.)
18. මෙම ක්‍රියාවලියේදී $NO_3^- \rightarrow NO_2^- \rightarrow N_2O \rightarrow N_2$ බවටත් පත් වේ.
19. මේ සඳහා *Pseudomonas* sp. දායක වේ.
20. නයිට්‍රජන් තිර කිරීමේදී, $N_2$ වායුව $NH_3$ බවට පත් කිරීමේ ක්‍රියාවලිය සිදු වේ.
21. $N_2$ තිර කරන බැක්ටීරියා ආකාර 2කි. $N_2$ තිර කරන නිදැලිවාසී බැක්ටීරියා
22. බොහොමයක් මුලගෝලයේ / මුල් වලට ආසන්න පරිසරයේ සිටී.

22 A/L අපි [ papers gro

23: උදා - Azotobacter sp. / Clostridium sp.

24. සහජීවී නයිට්‍රජන් තිර කරන බැක්ටීරියා.

25. රනිල ශාක වල මූලගැටිති සහ Rhizobium බැක්ටීරියා.

26. නිදැලිවාසී සයනොබැක්ටීරියා වන Nostoc.

27. රනිල නොවන ශාක ලයිකනා/( දිලීරය සමග ඇල්ගී හෝ සයනොබැක්ටීරියා)

Azolla සහ Anabaena ද නයිට්‍රජන් තිර කරයි.

15 + any 23
↓
$38 \times 4$ — 150

22 A/L අපි [ papers group ]

(9) a) මිනිසාගේ ලිංගය තීරණය වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

1) ලිංගිකත්වය තීරණය වන්නේ ලිංග වර්ණදේහ වල ප්‍රභේදය මගිනි.
2) මානව සෛලය තුළ සියලු පුද්ගලයෝ අලිංග වර්ණදේහ යුගල් 22ක්ද
3) එක් ලිංග වර්ණදේහ යුගලක්ද දරා සිටිති.
4) පුරුෂ භාව ලක්ෂණය තීරණය කරන ලිංග වර්ණදේහය Y වේ.
5) අනෙක් වර්ණදේහ වර්ගය X වර්ණදේහය ලෙස නම් කරයි.
6) ස්ත්‍රීන්ගේ ජන්මාණු ජනන ක්‍රියාවලියේදී ඒක දරා සිටින
7) 100 % ම X වර්ණදේහ දරයි.
8) පුරුෂයින්ගේ ජන්මාණු ජනන ක්‍රියාවලියේදී ඒක දරා ශුක්‍රාණුවලින්
9) අර්ධයක් X වර්ණදේහයක්
10) ඉතිරි අර්ධය Y වර්ණදේහයක් දරයි.
11) සංසේචනයේදී ඩිම්බය මෙන්ම ශුක්‍රාණුවද
12) X වර්ණදේහ රැගෙන එමෙන්
13) ස්ත්‍රී යුක්තාණුවක් ඇතිවේ.
14) ඩිම්බයක් Y වර්ණදේහය දරන ශුක්‍රාණුවක් සමග සංසේචනයෙන්
15) පුරුෂ යුක්තාණුවක් ප්‍රතිඵල වේ.

b) නිවර්තන වනාන්තර බියෝමයෙහි ලක්ෂණ විස්තර කරන්න.

1) නිරක්ෂයට සමීපව පවතින වී උපනිවර්තන ප්‍රදේශ වලටද විහිදී ඇත.
2) නිවර්තන වැසි වනාන්තර සහ
3) නිවර්තන වියළි වනාන්තර ලෙස ආකාර 2කි.
4) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය නිවර්තන වියළි වනාන්තරවල 2000 – 4000 mm වේ.
5) නිවර්තන වියළි වනාන්තර වල 1500 – 2000 mm වේ.
6) නිවර්තන වැසි වනාන්තර 25 – 29°C සාමාන්‍ය උෂ්ණත්වයක් පවතින අතර
7) නිවර්තන වියළි වනාන්තර වල 33°C පමණ ඉහළ අගයකි.

8) වර්ෂා වැසි වනාන්තර වල ස්ථරීභවනය
පෙන්වන්නේ කළ ඇතිරිය / පොළව ස්ථරය, පඳුරු
ස්ථරය, උපවියන් ස්ථරය, වියන් ස්ථරය (සියල්ලම)
9) වියන් ස්ථරය පඳුරු සහ විශාල ප්‍රභාසංශ්ලේෂක ගස
වලින් සමන්විත වේ.
10) බිම් ස්ථරය කුඩා ප්‍රභාසංශ්ලේෂක ගස.
11) ගසු සහ විශාල ගස පූට්මුල් වලින් සැදී ඇත.
12) වර්ෂා වැසි වනාන්තර වල සදාහරිත ගස ප්‍රමුඛයි.
13) වර්ෂා වියළි වනාන්තර වල පතනශීලී ගස වල නිතු වියළි
කාලවේල නැති හෝ.
14) වැසි වනාන්තර වල ආරෝහක සුලභය.
15) විසල් වනාන්තර වල කටු සහිත පඳුරු සහ
16) මාංශල ගස සුලබය.
17) සියලුම දෙකම බහුතරම අතුරින් ගස සහ සතුන්ගේ
ඉහළම විවිධත්වය ඇත.
18) වැසි වනාන්තර වල සතුන් වර්ෂය පුරා ක්‍රියාකාරීය.
19) කුඩා සතුන් අතර වෙනසත්කරණය සුලබය.
20) විශාල සතුන්ගේ දේහ වල සලකුණු ඇත.
21) සතුන් විවිධ කාල වලදී සංක්‍රමණය කරති.
22) කෘෂි කර්මාන්තය සහ
23) සංවර්ධනය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් වනාන්තර
විනාශයට මග පාදයි.

$15 + 23 = 38 \times 4$

ලකුණු 152

උපරිම ලකුණු 150

22 A/L අපි [ papers group ]

(10) පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

a) මිනිසාගේ රුධිර ග්ලූකෝස් සාමාන්‍ය සීමාව තුළ පවත්වා ගැනීමෙහි සමස්ථිතික යාමනය.

1. මිනිසාගේ සාමාන්‍ය රුධිර ග්ලූකෝස් මට්ටම 70 - 110 mg / 100 mL වේ.

ඉහළ, රුධිර ග්ලූකෝස් මට්ටම . සාමාන්‍ය සීමා ඉක්මවූ

2) ලැන්ගර්හැන්ස් දිපිකා, වල

3) බීටා සෛල වලින්

4) ඉන්සියුලින් හෝමෝනය රුධිරයට ස්‍රාවය වීම උත්තේජනය කරයි.

5. ඉන්සියුලින් විශිෂ්ට ඉලක්ක පටක මත ක්‍රියා කර රුධිර ග්ලූකෝස් මට්ටම පහළ දැමීම ප්‍රවර්ධනය කරයි

6. දේහ සෛල තුළට ග්ලූකෝස් අවශෝෂණය

7. දේහ සෛල මගින් ATP නිෂ්පාදනය සඳහා ග්ලූකෝස් භාවිතය

8. ග්ලූකෝස් මේද අම්ල බවට පරිවර්තනය

9. මේද, මේද පටක තුළ සංචිත කිරීම.

10. ග්ලූකෝස් ග්ලයිකෝජන් බවට පරිවර්තනය.

11. ග්ලයිකෝජන් අක්මා සෛල හා පේශී සෛල තුළ සංචිත කිරීම උත්තේජනය කරයි.

12. රුධිර ග්ලූකෝස් මට්ටම සාමාන්‍ය පරාසයට ළඟා වූ විට සෘණ ප්‍රතිපෝෂණය මගින්,

13. අග්න්‍යාශයෙන් ස්‍රාවය වන ඉන්සියුලින් මට්ටම, රුධිර ග්ලූකෝස් මට්ටම මගින් කෙළින්ම පාලනය කළ හැක.

(10) b) ආකියා අධිරාජධානිය.

1. ප්‍රාග් න්‍යෂ්ටික සහ
2. ඒක සෛලික වේ.
3. සෛල බිත්ති ප්‍රෝටීන සහ පොලිසැකරයිඩ වලින් සෑදී ඇත.
4. පටල ලිපිඩ වල සමහර හයිඩ්‍රොකාබන් ශාඛනය වී ඇත.
5. සමහර විශේෂ වල DNA සමඟ බැඳුණු හිස්ටෝන ප්‍රෝටීන ඇත.

22 A/L අපි [ papers gr

6. වෘත්තාකාර වර්ණදේහ දැකිය හැක.
7. සමහර ජාන වල ඉන්ට්‍රෝන ඇත.
8. RNA පොලිමරේස බොහෝ ප්‍රකාර ඇත.
9. ප්‍රෝටීන් සංශ්ලේෂණය සඳහා ආරම්භක ඇමයිනෝ අම්ලය මෙතියොනීන් වේ.
10. ප්‍රතිජීවක මගින් වර්ධනය නිශේධනය නොවේ.
11. ආන්තික උෂ්ණකාමී සහ
12. ආන්තික ලවණකාමී ආකාර අයත්ය.
13. මඩසහිත පරිසර වල සමහරු ජීවත් වෙති.
14. සමහර විශේෂ ගවයන් / වේයන් / වෙනත් ශාකභක්ෂකයන්ගේ ආහාර මාර්ග තුළ
15. [illegible] තත්ත්ව යටතේ වාසය කරයි.
16. උදාහරණ Methanococcus / Halobacterium / Thermococcus

ලකුණු 13 යි

(13)

c) මූලික සෛල චිකිත්සාව.

1) මූලික සෛල යනු විශේෂනය නොවූ සෛල වන අතර
2) ඕනෑම ආකාරයේම සෛල බවට පත් කළ හැකි සෛල වේ.
3) කලල මූලික සෛල / ES සෛල
4) වැඩිහිටි මූලික සෛල ලෙස ආකාර 2 කි.
5) බ්ලාස්ටුල කෝෂ්ඨයේ ඇතුළු සෛල ස්කන්ධය කලල මූලික සෛල වල ප්‍රභවයයි.
6) කලල මූලික සෛල pluripotent ලෙස හඳුන්වයි. / විවිධ ආකාරයේ සෛල බවට විකසනය වීමේ විභවයක් තිබීම.
7) මානව කලල මූලික සෛල වල ප්‍රභව ලබාගත් 2 කි.
8) සෛල ස්වයං නවීකරණය කළ හැකි වීම සහ
9) සුදුසු තත්ත්ව යටතේ විශේෂිත කෘත්‍ය සහිත විවිධ ආකාරයේ පරිණත සෛල බවට විශේෂණය විය හැක.
10) පරිණත මූලික සෛල විකසනයෙන් පසු දේහයේ සෑම පටකයකම හමුවේ.
11) මූලික සෛල වෙන්කරගෙන රෝගී මානව වල තැන්පත් කිරීම වගා කළ හැකිය.
12) ජාන චිකිත්සාවේදී ජාන සකසුම සඳහා ජාන ඇතුල්කිරීම
13) නව ඖෂධීය නිෂ්පාදන මගින් විද්‍යාගාර තුළදී පරීක්ෂා නව ඖෂධ නිර්මාණය සඳහා
14) ලියුකේමියා රෝගීන්ගේ ඇට මිදුළු ප්‍රතිස්ථාපනය
15) ආඝාතය / හෘද රෝග / පාකින්සන් / ඇල්සයිමර් / දියවැඩියාව වැනි රෝග සඳහා ප්‍රතිකාර ලබාදීම් කිරීම යොදා ගනියි.

ලකුණු 12

(74)

13 + 13 + 12 = 38 × 4 = 152

උපරිම ලකුණු 150